රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: **21/2017**

මගේ අංකය: Pns/P5/නව විශ්‍රාම වැටුප් ක්‍රමය
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ
අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2017.08.25

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

<u>**රජයේ නිලධාරීන් සඳහා නව විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීමට අදාළව පත්වීම් ලිපිය සංශෝධනය කිරීම.**</u>

2016 අයවැය යෝජනා අනුව රජයේ නිලධාරීන් හට නව විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීමට යෝජනා ඉදිරිපත් වී ඇති අතර රජය විසින් ඒ පිළිබඳව අවසන් තීරණයක් ගනු ලබන තෙක් 2016 ජනවාරි මස 01වනදා සිට ක්‍රියාත්මක වන පරිදි, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීන්හි අංක 01 පරිශිෂ්ඨය ප්‍රකාරව නවක රාජ්‍ය නිලධාරීන්ට පත්වීම් ලිපි නිකුත් කිරීමේ දී, එම පත්වීම් ලිපිවල 06වන වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට 2017.08.15 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කොට ඇත.

> **"මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය. "**

02 එබැවින් ඉහත විධිවිධාන අනුව 2016.01.01වැනි දිනෙන් පසු ලබාදෙන පත්වීම් ලිපිවල 06වැනි වගන්තිය සංශෝධනය කර ගැනීම මැනවි. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2017.06.30 හා 2017.08.14 දිනැති ලිපි මඟින් දන්වනු ලැබූ එකඟතාවය මත මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය